**ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූනි 13 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 637.32 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 634.65 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2.67 ක් හෙවත් සියයට 0.42 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 349.52 | 348.73 | 0.79 | 0.23 |
| මූලධන | 287.80 | 285.92 | 1.88 | 0.65 |
| **එකතුව** | **637.32** | **634.65** | **2.67** | **0.42** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 675.00 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.මිලියන 747.85 ක ආදායම් රැස් කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 110.79 ක් වී තිබුණි.

**2.3 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 32201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 19.00 | 18.99 | 13.00 | 17.55 | 82.00 | 58.66 |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0405/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 11.36 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 39.82 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0087/000 | 3.69 |
| 6000/0000/00/0013/0057/000 | 4.49 |
| 6000/0000/00/0016/0039/000 | 31.36 |
| 6000/0000/00/0018/0049/000 | 0.28 |
| **එකතුව** | **39.82** |

## 2.6 විගණන නිරීක්ෂණය

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

# 3 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පවත්වාගත යුතු ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

## 3.2 විසර්ජන ගිණුම

### අයවැය විචලනය

එක් මූලධන වැය විෂයයක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.මිලියන 1.55 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක් වී තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.3,091,028 ක් වූ තැන්පතු 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය

විෂය අංක 32201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2016 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.351,729 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01ක සිට වර්ෂ 11 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දෙපාර්තමේන්තුවේ හක්ගල උද්භිද උද්‍යානයට අයත් වටිනාකම තක්සේරු කර නොමැති ඉඩම් හෙක්ටයාර් 69 ක් පවුල් 97 ක් විසින් වසර 30 ට අධික කාලයක සිට අනවසරයෙන් අල්ලාගෙන තිබුණු අතර එම දේපල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### (ආ) බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.3,862,280 ක් වී තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

රජයේ නිවාස 02 ක වර්ෂ 05 ක් හා වර්ෂ 07 ක කාලයක් පදිංචි වී සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5:4 වගන්තිය ප්‍රකාර අඩු වැටුප් ලබන කලත්‍රයාගේ වැටුපෙන් අයකළ යුතු රු. 94,974 ක් හෙවත් සියයට 5 ක මුදල අයකර ගෙන නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

## 3.7 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**------------------------------------------------------**

වඳවී ගෙන යන ජීවී ශාක විතැන් සංරක්ෂණය හා ප්‍රචලිත කිරීම උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වී තිබුණත්, ජීවී ශාක විශේෂ 15 ක් වර්ෂ ගණනාවක සිට වඳවීයාමේ තර්ජනයට සහ වඳවීයාමේ අවදානමට ලක්ව පැවැතුණි. එම ශාක විශේෂ ව්‍යාප්ත කර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ආ)** **සැලැසුම් කිරීම**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) මල් වගා අංශයේ පටක රෝපිත ඇන්තූරියම් පැළ වාර්ෂික නිෂ්පාදන ඉලක්කය පැළ 25,000 ක් වුවද, ඉන් පැළ 17,048 ක් හෙවත් සියයට 68 ක් පමණක් සාධනය කරගෙන තිබුණි.

(ii) හිස් ජෑම් බෝතලයකින් පැළ 15 ක් පමණද, මි.ලී.750 හිස් බෝතලයකින් පැල 25 ක් පමණද ලබාගත හැකි වුවද, පටක රෝපණ අංශය මගින් පැළ ගෘහය වෙත නිකුත් කරන ලද පටක රෝපිත ඇන්තූරියම් බෝතල් සංඛ්‍යාව හා නිෂ්පාදනය කළ පැළ සංඛ්‍යාව සංසන්දනය කිරීමේදී එක් බෝතලයකින් එක් පැළයක් පමණ නිෂ්පාදනය කර තිබුණි.

**3.8** **කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ සේවයේ යොදවා තිබුණු ආරක්ෂක නිලධාරීන් 05 දෙනෙකු දිනකට පැය 24 බැගින්, අඛණ්ඩව මාසයකට දින 08 ක් හෝ 09 ක් සේවයේ යොදවා තිබුණි.

(ආ) සීතාවක උද්භිද උද්‍යානයේ සැලැස්ම අනුව පිවිසුම් මාර්ගය ආසන්නයේ ආපන ශාලාවක් හා තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකර තිබියදී එම ආපන ශාලාව ඉදිකර වසරක් යාමට මත්තෙන් වෙනත් ස්ථානයක රු.2,163,642 ක් වැයකර නව ආපන ශාලාවක් ඉදිකර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ කිසිදු ආයතනයක් විසින් නොපවත්වන මල් වගාව හා උද්‍යාන අලංකරණය විෂයයට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීමේ කාලීන අවශ්‍යතාවය හඳුනාගෙන ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ඒ සඳහා 2010 වර්ෂයේදී ලියාපදිංචි වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම පාඨමාලාව ආරම්භ කර පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 33 | 14 | 19 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 05 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 186 | 135 | 51 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 556 | 494 | 62 |
| | **එකතුව** | **785** | **648** | **137** |